පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# තෙවන වාර පරීක්ෂණය - 2023

| ශ්‍රේණිය |
|---|
| 08 |

## විෂයය :- පුරවැසි අධ්‍යාපනය - I , II

පාසලේ නම : ..............................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය ; පැය 02 යි.

- ❖ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 20කින් සමන්විතය.
- ❖ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස් වලට අනුකූලව සියලුම ප්‍රශ්න වලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.

- **අංක 01 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා සපයන ලද පිළිතුරු අතරින් වඩාත් නිවැරදි හෝ ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) සමාජයේ ඉදිරි දියුණුවට සම්පූර්ණ විය යුතු අවශ්‍යතාවයක් වන යටිතල පහසුකම් අතරට අයත් වන සාධකයක් වන්නේ,

1. නිවාස
2. ඇඳුම්
3. ජලය
4. ආහාර

(02) ගැටලුවක් විශ්ලේෂණය කිරීම සඳහා අනුගමනය කළ යුතු පියවර තුන නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

1) ගැටලුවට හේතු - ගැටලුව - ගැටලුව නිසා ඇතිවන බලපෑම
2) ගැටලුව නිසා ඇති වන බලපෑම - ගැටලුවට හේතු - ගැටලුව
3) ගැටලුව - ගැටලුවට හේතු - ගැටලුව නිසා ඇති වන බලපෑම
4) ගැටලුව - ගැටලුව නිසා ඇති වන බලපෑම - ගැටලුව

(03) "ප්‍රජාතන්ත්‍රවාදය" යන සංකල්පය දෙස විවිධ විද්වතුන් විසින් ප්‍රධාන වශයෙන් දෘෂ්ටිකෝණ දෙකකින් බලන්නට සමත්ව ඇත. එම ආකාර දෙක නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

1) ප්‍රජාතන්ත්‍රවාදය , නිර්ප්‍රජාතන්ත්‍රවාදය.
2) යුතුකමකි , අයිතිවාසිකමකි.
3) පාලන ක්‍රමයකි , ජීවන ක්‍රමයකි.
4) අයිතිවාසිකමකි , ජීවන ක්‍රමයකි.

(04) පිත්තල භාණ්ඩ, වෙස්මුහුණු හා රූකඩ නිපදවීම ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත සඳහා ප්‍රසිද්ධියක් උසුලන ප්‍රදේශ පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න .

1) අම්බලන්ගොඩ හා මොලගොඩ
2) පිලිමතලාව හා අම්බලන්ගොඩ
3) වේවැල්දෙණිය හා අම්පාර
4) පිලිමතලාව හා මොලගොඩ

(05) මාර්ග අනතුරු සිදුවීමෙහිලා බලපාන රියදුරන් අතින් සිදුවන වරදකි.

1) බීමත්ව රිය පැදවීම.
2) මහ මග දකුණු පසින් ගමන් නොකිරීම.
3) කණ්ඩායම් වශයෙන් ගමන් නොකිරීම.
4) මාර්ග නීති පිළිබඳ අවබෝධයෙන් සිටීම.

(06) ජාතික ආරක්ෂාව පිළිබඳ මෙහෙයුම් මධ්‍යස්ථානයේ දුරකථන අංකය දී ඇති පිළිතුරු වලින් තෝරන්න.

1. 559
2. 118
3. 119
4. 110

(07) ඕනෑම සමාජයක් මෙහෙයවනු ලබන බලවේගය ලෙස සැලකිය හැක්කේ පහත ඒවායින් කුමක්ද?

1. සංස්කෘතිය යි.
2. ආගම යි.
3. පවුල යි.
4. පාසල යි.

(08) තිරසර සංවර්ධනය ඇති කිරීමට ඔබට දායක විය හැකි ආකාරය වන්නේ,

1. අපද්‍රව්‍ය රිසි සේ බැහැර කිරීම.
2. නීති රීති වලට අනුකල නොවීම.
3. බලශක්ති සංරක්ෂණය.
4. සම්පත් අධි පරිභෝජනය.

(09) ශ්‍රමයේ ඵලදායිතාවය ඇති වන්නේ,

1) ශ්‍රමිකයාගේ දැනුම, කුසලතා හා ආකල්ප මට්ටම අනුවය
2) ශ්‍රමය සඳහා ලැබෙන ප්‍රතිලාභය අනුවය
3) ශ්‍රමිකයන් සපයන රැකියාවේ ස්වාභාවය අනුවය
4) අධ්‍යාපනයෙන් ලැබෙන දැනුම අනුවය

(10) සමබර පෞරුෂයකින් හෙබි පුද්ගලයා තුළින් නිරතුරුව පෙනෙන ලක්ෂණයක් වන්නේ,

1. ආත්මාර්ථකාමී බවය.
2. ආවේග වලට ලක් නොවීමය.
3. කලබලකාරී හැසිරීමය.
4. විවේචනය කිරීමය.

- අංක 11 සිට 15 තෙක් දී ඇති ප්‍රකාශ නිවැරදි නම් " නි " අකුර ද වැරදි නම් " වැ " අකුර ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

(11) ජපන් වැසියන් පරිසර හිතකාමී වාහනයක් ලෙස මෝටර් රථය බහුලව භාවිතා කරයි. (..............)

(12) බටහිර වෛද්‍ය ක්‍රමය , දේශීය ආයුර්වේද වෛද්‍ය ක්‍රමය , සිද්ධි යුනානි හා හෝමියෝපති යන වෛද්‍ය ක්‍රම දිවයින තුළ ක්‍රියාත්මක වේ. (..............)

(13) ' සුව දිවි මධ්‍යස්ථානය ' බෝවන රෝග වැලැක්වීම අරමුණු කරගෙන දිවයින පුරා ක්‍රියාත්මක වේ . (..............)

(14) ශ්‍රී ලංකාවේ ළදරු මරණ සංඛ්‍යාව හා මාතෘ මරණ සංඛ්‍යාව ඉහළ මට්ටමක පවතී. (.............)

(15) වැඩ ලෝකය යනු අපගේ පැවැත්මට අවශ්‍ය කාර්යයන් හා සේවා සපයන සියලු ම අංශ වේ. (..............)

- අංක 16 සිට 20 තෙක් දී ඇති ප්‍රශ්නවල හිස්තැන මත නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර ලියා දක්වන්න.

(16) මිනිසා සාමූහිකව කටයුතු කරන සෑම අවස්ථාවකම ඔහු මෙහෙය වීම සඳහා ...................................................... අවශ්‍ය වේ.

(17) නිදහස් අධ්‍යාපනය ශ්‍රී ලංකාවට හඳුන්වාදීමේ ගෞරවය ආචාර්ය .................................................. මැතිතුමාට හිමි වේ.

(18) මෑතක දී ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ශ්‍රී ලංකාව ................................................ දුරු කල රටක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

(19) මුස්ලිම් ජනතාවගේ ශුද්ධ භූමිය ලෙස .................................................... සලකනු ලබයි.

(20) නිවර්තන කලාපය තුළ වේගවත්ව හට ගන්නා ප්‍රචණ්ඩකාරී සුළං ........................................................... නමින් හැඳින්වේ.

(ල.02 X 20 = 40)

## II කොටස

- ❖ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ❖ ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතුය. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05කි.

(01) I) නොමිලේ සපයන හා මුදල් අය කර සපයන පොදු සේවා එක බැගින් නම් කරන්න.
II) පොදු සේවාවල පොදු ලක්ෂණ දෙකක් නම් කරන්න.
III) සෞඛ්‍ය සේවය මගින් ඉටු කරන ප්‍රධාන කාර්යයන් දෙකක් නම් කරන්න.
IV) රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් දෙකක් නම් කරන්න.
V) පරිසර සංරක්ෂණය සඳහා රජය මගින් පිහිටුවා ඇති ආයතන දෙකක් නම් කරන්න.
VI) පොදු සේවා ප්‍රයෝජනයට ගන්නා පුරවැසියන් විසින් ඉටු කළ යුතු යුතුකම් දෙකක් නම් කරන්න. (2 X 6 = 12)

(2) " පවුල හැරුණු විට දරුවෙකුට සමීපතම ආයතනය පාසල යි. "

I) පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ දෙකක් ලියන්න. (ල.2)
II) ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයක් හුරුකිරීම සඳහා පාසල විසින් ක්‍රියාත්මක කරන විෂය සමගාමී ක්‍රියාකාරකම් හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.2)
III) ප්‍රජාතන්ත්‍රවාදී නායකයෙකු සතු විය යුතු ගුණාංග හතරක් සඳහන් කරන්න. (ල.2)
IV) සමාජය තුළ යහපත් පුරවැසියෙකු බිහි කිරීමට ඉවහල් වන ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.4)

(3) I) බහු සංස්කෘතික සමාජ පවතින රටවල් දෙකක් නම් කරන්න. (ල.2)
II) අප රටේ ආගම පදනම් කරගෙන ගොඩනැගී ඇති පහත සංස්කෘතීන්ට අදාළ ආගමික උත්සවය බැගින් නම් කරන්න.
A ) බෞද්ධ සංස්කෘතිය -
B) හින්දු සංස්කෘතිය -
C) ක්‍රිස්තියානි සංස්කෘතිය -
D) ඉස්ලාම් සංස්කෘතිය- (ල.4)
III) බහු සංස්කෘතික රටක් වශයෙන් ඇමරිකා එක්සත් ජනපදය තම කටයුතු සඳහා අනුගමනය කරන ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ල.2)
IV) ජාතික සමගිය හා තිරසර සාමය ගොඩනගා ගැනීමේ වාසි දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.4)

(4) " වර්තමානයේ මිනිසාට විවිධ අනතුරු හා විපත් වලට මුහුණ දීමට සිදුවී ඇත "

I) ස්වාභාවිකව හටගන්නා හා මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇති වන විපත් එක බැගින් නම් කරන්න. (ල.2)
II) නියගය නිසා ඇති වන අයහපත් ප්‍රතිඵල දෙකක් නම් කොට නියගයෙන් ආරක්ෂා වීමට ගත හැකි ජල සංරක්ෂණ ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ල.4)
III) අනතුරු හා ආපදා වලදී සහය ලබා ගත හැකි ආයතන හතරක් නම් කරන්න. (ල.4)
IV) ඖෂධ භාවිතයේ දී ඔබ සැලකිළිමත් විය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න. (ල.2)

(5) " ශ්‍රී ලංකාවේ මාර්ග අනතුරු වර්තමානයේ සුවිශේෂ අංගයක් බවට පත්ව ඇත."

I) මාර්ග අනතුරුවලදී රියදුරන් අතින් සිදුවන වැරදි දෙකක් හා පදිකයන් අතින් සිදුවන වැරදි දෙකක් සඳහන් කරන්න. (ල.2)
II) දුම්රිය අනතුරු වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග හතරක් සඳහන් කරන්න. (ල.4)
III) "තිරසර සංවර්ධනය" යන්න කෙටියෙන් හඳුන්වන්න. (ල.2)
IV) තිරසර සංවර්ධනය ඇති කිරීමට දායක වීමේ දී සැලකිළිමත් විය යුතු කරුණු හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.4)

(6) පුද්ගල ජීවිතයේ දී මෙන්ම සමාජ ජීවිතයේ දී පුද්ගලයාට විවිධ අභියෝග වලට හා ගැටලු වලට මුහුණ පෑමට සිදුවී තිබේ ."

I) ඕනෑම පුද්ගලයෙකුට මුහුණ දීමට සිදුවන විවිධ මාදිලියේ ගැටලු දෙකක් නම් කරන්න. (ල.2)

II) පාසල් සිසුන් වශයෙන් ඔබ දෛනිකව මුහුණපාන ගැටලු හතරක් සඳහන් කරන්න. (ල.4)

III) a) අභියෝග යනු කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.2)

b) අභියෝග ජය ගැනීමට අවශ්‍ය වන ඔබ තුල වර්ධනය කරගත යුතු ලක්ෂණ මොනවාද? (ල.4)

(7) " වැඩ ලෝකය තුළ පවතින සෑම රැකියාවක්ම සමාජයේ පැවැත්මට හේතු වේ."

I) වැඩ ලෝකයේ රැකියා අයත් වන ක්ෂේත්‍ර දෙකක් නම් කරන්න (ල.2)

II) ශ්‍රමාභිමානයෙන් කටයුතු කිරීමෙන් ,

a) සේවායෝජකයාට අත් වන ප්‍රයෝජන දෙකක් හා

b) සේවාලාභියාට අත්වන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ල.2 X 2 = 4)

III) වෘත්තීය පුහුණුව ලබා දෙන ආයතන දෙකක් නම් කොට ඒවායින් ලබා ගත හැකි වෘත්තීය පාඨමාලා දෙකක් සඳහන් කරන්න. (ල.4)

IV) යහපත් ශ්‍රමිකයෙකු තුල තිබිය යුතු ගුණාංග හතරක් සඳහන් කරන්න. (ල.2)

# පිළිතුරුපත්‍රය පුරවැසි අධ්‍යාපනය - 2023
## 08 ශ්‍රේණිය - III වාර විභාගය

1) 03
2) 03
3) 03
4) 02
5) 01
6) 02
7) 01
8) 03
9) 01
10) 02
11) වැ
12) නි
13) වැ
14) වැ
15) නි
16) නායකයෙකු
17) C.W.W. කන්නන්ගර
18) මැලේරියාව
19) මක්කම
20) සුළි සුලං

(1) 1) නොමිලේ - සෞඛ්‍ය, අධ්‍යාපනය , ආරක්ෂක සේවා.

මුදල් අයකර - ප්‍රවාහනය, ජලසම්පාදන, සමුපකාර, විදුලිය, පණිවිඩ හුවමරු, තැපැල් සේවය.

2) පොදු ලක්ෂණ

- කිසිදු භේදයකින් තොරව සියලුම පුරවැසියන්ට පොදුවේ ප්‍රයෝජනයට ගත හැක.
- ලාභයට වඩා මහජන සුභ සිද්ධිය අරමුණු කර පවත්වාගෙන යයි.
- ජනතාවගේ ජීවන තත්වයේ ගුණාත්මක සංවර්ධනය අරමුණු කරයි.
- අඩු ආදායම් ලාභීන්ට පහසුවෙන් ලබා ගත හැක.
- පුද්ගල සංවර්ධනය තුලින් සමාජ සංවර්ධනයට දායක වේ.
- මූලික අවශ්‍යතා ඉටුකර ගැනීමට සහය වේ.
- පොදු සේවා පවත්වාගෙන යාම හා ආරක්ෂා කිරීම සඳහා නීති රීති පද්ධතියක් ක්‍රියාත්මක වීම.

3)

- රෝගී ප්‍රතිකාර
- රෝග වැලැක්වීම හා පාලනය
- ප්‍රතිශක්තිකරණ වැඩසටහන්
- වෛද්‍ය සායන
- මාතෘ සායන
- රෝග විනිශ්චය සඳහා පර්යේෂණ
- සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන්
- පාසල් සිසුන් සඳහා සායන පැවැත්වීම හා දන්ත චිකිත්සාගාර පවත්වාගෙන යාම.
- ළදරුවන් හා මවුවරුන් සඳහා පවුල් සෞඛ්‍ය සේවා වැඩසටහන්.
- හදිසි අනතුරු සේවා ක්‍රියාත්මක වීම.

(4) 1)

- සාකච්ඡා මගින් නිවැරදි තීරණ වලට එළඹීම.
- සෑම දෙනාගේම කැමැත්ත මත විමසීම හා එකග වීම.
- නායකත්වයට ගරු කිරීම / සහයෝගයෙන් කටයුතු කිරීම
- අධ්‍යාපනය ,භෞතික සම්පත්, පෙලපොත්,නිල ඇඳුම්, පුස්තකාල, ක්‍රීඩා හා වෙනත් පහසුකම් සමානව ලැබීම
- උපේක්ෂාවෙන් ජය පරාජය භුක්ති විඳීම හා සාමකාමීව ගැටලු නිරාකරණය.

- සමිති සමාගම් වල තනතුරු ලබා ගැනීම, අදහස් ප්‍රකාශ කිරීම, ඡන්දය ලබා දිම.
- පාසල තුළ පවතින පොදු නීතිරීති සම්ප්‍රදායන් පිළිගැනීම සහ ආරක්ෂා කිරීම.

2)

- සාහිත්‍ය සමිති, ආගමික, ක්‍රීඩා, විෂයානුබද්ධ යනාදී සමිති පැවැත්වීම.
- ජාතික උත්සව, ආගමික උත්සව,ක්‍රීඩා උත්සව, සංස්කෘතික උත්සව සංවිධානය.
- ශිෂ්‍ය නායක, පන්ති නායක, විෂය නායක , ක්‍රීඩා නායක ලෙස වගකීම් පැවරීම.
- නර්තනය, ගායනය, වාදනය, චිත්‍ර ඇදීම, සාමාන්‍ය දැනිම, රචනා, විවාද වැනි තරග සංවිදානය හා පැවැත්වීම
- ශිෂ්‍යභට ,පරිසරභට ,බාලදක්ෂ , ප්‍රථමාධාර සේවා පුහුණුව හා අත්දැකීම ලබා දීම
- අධ්‍යාපන චාරිකා, ක්ෂේත්‍ර චාරිකා, ගවේෂණ චාරිකා, විනෝද චාරිකා සංවිධානය කිරීම

3)

- මානව හිතවාදී බව
- අවංක කම
- කැපවීම
- සමානාත්මතාව
- මිත්‍රශීලී බව
- නිර්මාණශීලී බව
- නිවැරදි තීරණ ගැනීම
- ආත්ම විශ්වාසය
- ස්ථීරසාර බව
- සවන් දීම
- පක්ෂග්‍රාහී නොවීම
- සමාජශීලී වීම්
- දූරදක්නා නුවණ
- අන් අයට උදව් කිරීම

4)

- අන් අයගේ මතයට ගරු කිරීම
- සහයෝගයෙන් කටයුතු කිරීම
- අයිතිවාසිකම් භුක්ති විඳිම් යුතුකම් ඉටු කිරීම්
- සාකච්ඡා මගින් තීරණ වලට එලඹීම
- ස්වයං විනයකින් යුතුව කටයුතු කිරීම
- සමානාත්මතාවයට ගරු කිරීම
- විනිවිද භාවයකින් කටයුතු කිරීම
- අවංකව හා නීතිගරුකව කටයුතු කිරීම්
- අන් අයගේ අයිතිවාසිකම් වලට ගරු කිරීම
- විවිධ මත ඉවසීම

(3) 1)

- ශ්‍රී ලංකාව
- ඉන්දියාව
- ඇමරිකා එක්සත් ජනපදය
- බ්‍රිතාන්‍යය

2)

බෞද්ධ-

- වෙසක්
- පොසොන්
- ඇසල

හින්දු-

- තෛපොංගල්
- මහා ශිව රාත්‍රී
- දීපවාලි

ක්‍රිස්තියානි-

- නත්තල්
- පාස්කු

ඉස්ලාම්-

- රාමසාන්
- මිලාදුන් නබි
- හජ්ජි

3)

- ඉංග්‍රීසි භාෂාව රාජ්‍ය භාෂාව ලෙස පිලිගැනීම.
- කිසිදු ආගමක් රාජ්‍ය ආගම ලෙස නොපිලිගැනීම.
- සෑම පුරවැසියෙකුටම සමාන අයිතිවාසිකම් හිමි වීම.
- ප්‍රජාතන්ත්‍රවාදය පිළිගැනීම හා ඊට අනුකූලව ක්‍රියා කිරීම්.

4)

- එකිනෙකා අතර අවබෝධය ඇති වී විශ්වාසයෙන් යුතුව කටයුතු කිරීම නිසා ගැටුම් අවම වේ.
- ජන කොටස් අතර සමගිය තහවුරු වේ.
- රට සංවර්ධනය කිරීම සඳහා සියලු දෙනාගේම දායකත්වය ලැබේ.
- එකමුතුව හා සාමූහිකව කටයුතු කිරීමට පෙලඹීමක් ඇති වේ.
- ඵලදායී ආර්ථික කටයුතු වල යෙදෙමින් රට සංවර්ධනය කිරීමට දායක වේ.
- සංස්කෘතික විවිධත්වයට ගරු කිරීම හා එකිනෙකාගේ යුතුකම් හා වගකීම් නොපිරිහෙලා ඉටු කිරීමට පෙළඹේ.

(4) 1) ස්වාභාවික ක්‍රියාකාරකම් - ගං වතුර,නියග,අකුණු කුණාටු,ටොනාඩෝ,ලැව් ගිනි,භූ චලන,සුනාමි, භූමි කම්පා

මිනිස් ක්‍රියාකාරකම් - රිය අනතුරු, රසායනික ද්‍රව්‍යය අනිසි භාවිතය, අනාරක්ෂිත ඉදි කිරීම්, පතල් කැනීම්, තාක්ෂණික විද්‍යුත් මෙවලම් අවභාවිතය, අක්‍රමවත් කැළි කසල බැහැර කිරීම්

2) අයහපත් ප්‍රතිඵල - පානීය ජල හිගය, ජලවිදුලි බල උත්පාදනය ඇනහිටීම, ජල උල්පත්, කුඩා වැව් සිදී යාම, භූගත ජල මට්ටම පහළ යාම,මිනිස් ජීවිත හානි,වගා භූමි විනාශ වීම,වන සතුන් වද වී යාම

සංරක්ෂණ ක්‍රම - වනආවරණ ඉවත් නොකිරීම, තද රස්නයට පස නිරාවරණය නොකිරීම, ජලය සුරැකීම, ඇළ දොළ ගංගා අපවිත්‍ර නොකිරීම, ගස් වැල් සිටුවීම, වන වගාව , ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම, වැසි ජලටැංකි භාවිතය

3)

- ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන
- රෝහල
- පොලීසිය
- කාලගුණවිද්‍යා දෙපාර්තමේන්තුව
- පළාත් පාලන ආයතන
- රතු කුරුස සංවිධානය
- ගිනි නිවන ඒකකය
- ත්‍රිවිධ හමුදාව

4)

- නියමිත වෛද්‍ය උපදෙස් පිළිපැදීම
- ඖෂධ වල නියමිත මාත්‍රාව භාවිතය
- නියමිත වේලාවට ඖෂධ ගැනීම
- කල් ඉකුත් වීමේ දිනය පිළිබඳ සැලකිලිමත් වීම
- ඖෂධ නියමිත උෂ්ණත්වයේ ගබඩා කිරීම
- භාවිතයට පෙර අසුරනයේ ඇති උපදෙස් සැලකිල්ලෙන් කියවීම
- අන්තරායකාර ඖෂධ භාවිතයෙන් වැලකීම

(5) 1) රියැදුරන් අතින් සිදුවන වැරදි-

විනයගරුක නොවීම්, බීමත්ව රිය පැදවීම, වලංගු රියදුරු බලපත්‍රයක් ලබා නොගෙන රිය පැදවීම , මාර්ග සංඥා හා පොලිස් නිලධාරීන් දෙන විධාන නොපිළිපැදීම, අධික වේගය, අධික ලෙස වෙහෙසට පත්ව තිබියදී රිය පැදවීම, රිය පැදවීමේදී වෙනත් වාහන හා පදිකයන් කෙරෙහි සැලකිලිමත් නොවීම, කාලගුණ තත්වය පිළිබඳ අනවධානය, පදවන අතරතුර ජංගම දුරකථන භාවිතය, මගීන් වැඩිපුර රැගෙන යාම, අනවශ්‍ය තරගය.

පදිකයන් අතින් සිදුවන වැරදි-

මාර්ග සංඥා හා මාර්ග නීති පිළිබඳ සැලකිළිමත් නොවීම, මහ මග දකුණු පසින් ගමන් නොකිරීම, කණ්ඩායම් වශයෙන් ගමන් කිරීම, පාර මාරු වීමේදී කහ ඉර හෝ පදික මාරු හෝ භාවිතා නොකිරීම, ජංගම දුරකථන භාවිත කරමින් ගමන් කිරීම, රාත්‍රී කාලයේදී කළු ඇඳුම් ඇද ගමන් කිරීම.

2)

- මගීන් පා පුවරුවේ ගමන් නොකිරීම.
- දුම්රිය මාර්ගයේ පදිකයන් ගමන් නොකිරීම.
- මගින් ධාවනය වන දුම්රියට නැගීමෙන් හෝ බැසීමෙන් වැළකීම.
- දුම්රිය මාර්ග සංඥා නිසි පරිදි ක්‍රියාත්මක කිරීම.
- දුම්රිය මාර්ග පිළිසකර කිරීම හා නඩත්තු කිරීම.
- දුම්රිය මාර්ග හරහා ආරක්ෂිත ගේට්ටු භාවිතය විධිමත් කිරීම.
- සංඥා නිසියාකාරව ක්‍රියාත්මක වන්නේ දැයි දුම්රිය පාලක මැදිරිය මගින් නිරතුරුව සොයා බැලීම.

3) අනාගත පරපුරට ඔවුන්ගේ අවශ්‍යතා ඉටුකර ගැනීමට බාධා නොවන අයුරින් වත්මන් පරපුරේ අවශ්‍යතා ඉටුකර ගැනීම ති රසාර සංවර්ධනය ලෙස සරලව හඳුන්වා දිය හැකිය.

4)

- සම්පත් අධි පරිභෝජනයෙන් වැලකීම.
- පරිසර හිතකාමී ජීවන රටාවකට හුරු වීම.
- රටේ පවතින නීති රීති වලට අනුකූලව කටයුතු කිරීම.
- භෞතික සම්පත් ආරක්ෂා කිරීම.
- අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම.
- බලශක්ති සංරක්ෂණය.
- සම්පත් අරපිරිමැස්මෙන් භාවිතය.
- පරිසර හිතකාමී විකල්ප බලශක්ති පිළිබඳ අවධානය යොමු කිරීම.

(6) 1)

- භෞතික ගැටලු
- මානසික ගැටලු
- ආර්ථික ගැටලු
- තාක්ෂණික ගැටලු
- පරිසර ගැටලු
- සමාජමය ගැටලු
- කායික ගැටලු

2)

- ආහාර හා පෝෂණ ගැටලු
- තමන් ආශා කරන දේ නොලැබීම
- අරක්ෂාව හා සුරක්ෂිත බව නොමැති වීම
- ඇතැම් පාසල් වල පවත්නා සම්පත් හිගය
- අර්ථික අපහසුතා
- විභාග වලින් අසමත් වීම
- ආදරය නොලැබීම
- ක්‍රීඩා කිරීමට හෝ විවේකය ගත කිරීමට හෝ කාලයක් නොමැති වීම.
- තරගකාරී ලෙස විභාග වලට මුහුන දීමට සිදු වීම

3) a ) ජීවිත ඉලක්ක ජය ගැනීමේදී සිදුවන විවිධ බාධා අභියෝග වේ.

b )

- ඵලදායී සන්නිවේදනය
- නිවැරදි තීරණ ගැනීම
- ගැටලු විසඳීම
- විචාරශීලී චින්තනය
- නිර්මාණශීලී චින්තනය
- යහපත් අන්තර් පුද්ගල සබඳතා
- කරුණාව / මුදිතාව
- චිත්ත වේග හැසිරවීම්

7) 1)

- රාජ්‍ය අංශය හා අර්ධ රාජ්‍ය අංශය
- පෞද්ගලික අංශය
- ස්වයං රැකියා

2) a) සේවා යෝජකයාට-

- තම ආයතනයේ කීර්තිනාමය ඉහළ නැංවීම.
- අයතනය කෙරෙහි මහජන ප්‍රසාදය හිමිවීම.
- තරගකාරී ආයතන සමග කටයුතු කිරීමට හැකි වීම.
- සේවක පෙළඹවීම වැඩි වීම.
- අයතනයෙන් ලැබෙන ලාභය වැඩි වීම.

b) සේවා ලාභියාට-

- තම අවශ්‍යතා පහසුවෙන් ඉටුකර ගත හැකි වීම.
- සාමාජීය කාර්යයක්ෂමතාව ඇති වීම.
- චිත්තවේග සමබරතාව ඇති වීම.
- ආයතන කෙරෙහි හිතවත් බවක් ඇති වීම.
- විශ්වාසනීයත්වය ගොඩ නැගීම.

3) ආයතන - වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික ආධුනිකත්ව මණ්ඩලය, ජාතික තරුණ සේවා සභාව, කාර්මික විද්‍යාල, උසස් තාක්ෂණික ආයතන, හෝටල් පාසල්, නැණසල

පාඨමාලා - විදුලි කාර්මික, ජලනළ ශිල්පී, සැලසුම් ඇඳීම, පරිගනක, ඉංග්‍රීසී හා වෙනත් භාෂා, ආහාර සැකසීම, ගෘහ අලංකරණය, රූපලාවන්‍ය

4)

- සංවේදීකම
- සමාජශීලීත්වය
- ආචාරශීලීබව
- පරීක්ෂාකාරීබව
- වෙලාවට වැඩ කිරීම
- වගකීම් සහිත බව
- ඉවසිලිමත් බව
- නිර්මාණාත්මක බව
- උනන්දුව
- අවංක කම
- කාර්යයක්ෂමතාව
- සංවිධානාත්මක බව
- විනෝදශීලී බව


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න